සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**Royal College - Colombo 07**
**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

33 S I

**Grade 10 – First Term Test – July 2023**

කාලය : පැය 1
Time: 1 hour

පළමු වාර පරීක්ෂණය - 2023 - 10 ශ්‍රේණිය

# ඉතිහාසය - I

Name: - ........................................................................................ Class: -.................. Index no: - .......................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම කෘතිය ලෙස සැලකෙන්නේ,
(1) මහාවංශය (2) දීපවංශය (3) පූජාවලිය (4) රාජාවලිය

02. මහාවංශයේ අර්ථවිවරණය කිරීමට ලියවුණු ග්‍රන්ථය වන්නේ,
(1) වංසත්ථප්පකාසිනී (2) ජාතකට්ඨකතාව
(3) උත්තරවිහාරට්ඨකතා (4) රාජාවලිය

03. පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංසකතා ලියවී ඇත්තේ,
(1) ශිලා පුවරුවල (2) රන් හෝ තඹ පත්‍රවල
(3) මැටි පුවරුවල (4) පුස්කොළ පොත්වල

04. පහත "අ" තීරුව හා "ආ" තීරුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. පාහියන් හිමි | A. අරාබි |
| 2. ඉබන් බතූතා | B. පෘතුගීසි |
| 3. ෆිලිප්පස් බැල්ඩියස් | C. චීන |
| 4. රිබෙයිරෝ | D. ඕලන්ද |

(1) CADB (2) CBAD (3) CABD (4) CBDA

05. මහාවංශය සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) මහාවංශයේ මුල් කොටස දික්සඳ සෙනවියා පිරිවෙනේ මහානාම හිමියන් විසින් රචනා කරන ලදී.
(2) ඇතැම් ඓතිහාසික පුවත් කෙටියෙන් දැක්වීමත්, පුනරුක්ති දෝෂ දක්නට ලැබීම.
(3) මුල් කොටස ලිවීමෙන් අනතුරුව කොටස් කිහිපයකින් යුක්තව අඛණ්ඩව ලියවුණු කෘතියකි.
(4) ක්‍රි.ව. පස්වන හෝ හය වන සියවසේ දී රචනා විය.

06. තමන් විසින් නුදුටු වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ කතුවරුන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) ඇරිස්ටෝටල්, ප්ලිනි, රොබට් නොක්ස්
(2) හියුංසියැං හිමි, මෙගස්තිනිස්, ප්ලිනි
(3) ක්වෙරෝස්, ඉබන් බතූතා, ටොලමි
(4) රිබෙයිරෝ, ඔනෙසික්‍රිටස්, ඇරිස්ටෝටල්

07. අභිලේඛන පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) ටොලමිගේ සිතියම, ඉංග්‍රීසි හටන කෘතිය (2) පනාකඩුව තඹ සන්නස, එදාහෙළදිව කෘතිය.
(3) සීගිරි ගී, වල්ලිපුරම් රන්පත. (4) ගල්පොත ශිලා ලිපිය, සැලලිහිණි සංදේශය.

08. මෙරටින් හමුවන පැරණිතම කාසිය ලෙස හඳුනාගත්තේ,
(1) කහාපණ (2) තඹ මස්ස (3) ලක්ෂ්මී කාසිය (4)

09. මිනිසා සහ අශ්ව හිස මූර්තියෙන් නිරූපණය වන දෙවිවරුන් වන්නේ,
(1) විෂ්ණු සහ ශිව (2) අග්නි සහ විෂ්ණු
(3) අග්නි හා පර්ජන්‍ය (4) විෂ්ණු හා පර්ජන්‍ය

10. භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම වැනි දේ වාර්තා කර තැබීමට මෙරට ලියා ඇති පැරණි ලේඛන වර්ග පහත කුමන නමකින් හැඳින්වේද ?
(1) ගිරිලිපි (2) පුවරු ලිපි (3) බ්‍රාහ්මීය ලිපි (4)

11. ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත් වූයේ මීට අවුරුදු කොපමණ කලකට පෙරද ?
(1) වසර 3000 කට පෙර (2) වසර 125000 කට පෙර
(3) වසර 12500 කට පෙර (4) වසර 38000 කට පෙර

12. ඉරණමඩු සැකැස්ම ලෙස පුරාවිද්‍යාඥයින් හඳුන්වන්නේ,
(1) රත්නපුර ප්‍රදේශයේ ඉල්ලම්වලින් හමුවන පස් තට්ටුවයි.
(2) කඳුකර තෙත් කලාපීය බොරලු තට්ටුවයි.
(3) අර්ධ ශුෂ්ක කලාපයේ පොළවේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරලු තට්ටුවයි.
(4) පහතරට වියලි කලාපයේ වැලි වලින් වැසුණු බොරලු තට්ටුවයි.

13. පහතරට වියළි කලාපයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථාන පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,
(1) අලිගල, අලුගල්ගේ, පොම්පරිප්පු, කුඩුම්බිගල
(2) පිදුරන්ගල, අලිගල, දඹුල්ල, කන්දකාඩු
(3) මිනිහාගල්කන්ද, අලිගල, දඹුල්ල, උඩමළල
(4) පරන්තත්, අලුගල්ගේ, අලිගල, බූන්දල

14. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයන්ගේ වාසස්ථාන අතර වඩා ඉපැරණි බවට කාලනිර්ණය කර ස්ථානය වන්නේ,
(1) පාහියන්ගල (2) අත්තනගොඩ අළුලෙන
(3) බෙල්ලන්බැඳිපැලැස්ස (4) කුරුවිට බටදොඹලෙන

15. කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන වන්නේ,
(1) පතිරාජවෙල, හෝර්ටන්තැන්න (2) පොතාන, පාහියන්ගල
(3) බූන්දල, බණ්ඩාරවෙල (4) බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න

16. ගල් යුගයේ මානවයාගේ ආහාර රටාව සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය වන්නේ,
(1) ආහාර රටාව පිළිබඳ වඩා වැඩිපුර සාධක ලැබෙන්නේ පහතරට වියලි සහ තෙත් කලාපීය ගුහාවලිනි.
(2) ආහාර පුළුස්සා අනුභව කළ බවට සාක්ෂි පරීක්ෂා කිරීමේදී පෙනී යයි.
(3) පිෂ්ටය ලබා ගැනීම සඳහා ශාක ආහාර වගා කිරීමෙන් ලබා ගත් බවට සාධක ඇත.
(4) ආහාර සඳහා අවශ්‍ය ලුණු ලබා ගැනීමට ඉතා දුර බැහැර ගමන් කර ඇත.

17. සකපෝරුව භාවිතා කරමින් මැටි වළං නිර්මාණය කළ බවට සාක්ෂි හමුවන ස්ථාන දෙකක් වන්
(1) උඩරංචාමඩම, හල්දුම්මුල්ල (2) හල්දුම්මුල්ල, යටිගල්පොත්ත
(3) බෙරගල, සීගිරිය (4) උඩරංචාමඩම, ඉබ්බන්කටුව

18. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික ජනතාවගේ ජීවන රටාව සම්බන්ධව වඩා නිවැරදි ප්‍රකා නොවන්නේ,
(1) කාන්තාවන් තම රූ සපුව අලංකාර කිරීම ගැන මහත් උනන්දුවක් දක්වා ඇත.
(2) යකඩ මෙවලම් පමණක් භාවිතා කළ අතර ගල් මෙවලම් භාවිතය නවතා දමා තිබිණි.
(3) සතුන් දඩයම් කිරීම සම්පූර්ණයෙන් අත්හැර නොදැමූහ.
(4) කෘෂිකර්මාන්තයේ යෙදෙමින් ශාක ආහාර සපයා ගැනීමට හුරු වී සිටියහ.

19. මුල් ඓතිහාසික යුගය වශයෙන් සැලකෙන්නේ,
(1) ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 450 කාලය (2) ක්‍රි.ව. 300 - ක්‍රි.ව. 450 අතර කාලය
(3) ක්‍රි.පූ. 450 - ක්‍රි.ව. 300 කාලය (4) ක්‍රි.පූ. 7000 - ක්‍රි.පූ. 4500 අතර කාලය

20. මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ත වූයේ,
(1) වියළි කලාපයේ
(2) පහතරට තෙත් කලාපයේ
(3) කඳුකර තෙත් කලාපයේ
(4) ශුෂ්ක කලාපයේ

21. ගංගාවක පිටාර නිම්නයෙන් පිටත ප්‍රදේශවල ජනාවාස ව්‍යාප්ත වීමේදී ඒවායේ ජීවත් වූ ජනතාවගේ ප්‍රධාන යැපීම් ක්‍රමය වූයේ,
(1) මහා පරිමාණ වී ගොවිතැන
(2) හේන් ගොවිතැන
(3) සත්ව පාලනය
(4) සතුන් දඩයම් කිරීම.

22. පරුමකවරයෙකුට අයත් නොවන කාර්යයකි,
(1) වැව් ගම්මානවලට බලපාන පොදු තීරණ ගැනීම.
(2) වැව් පද්ධතිය නඩත්තු කිරීම.
(3) ගම් අතර ආවාහ කටයුතු වලදී මැදිහත් වීම.
(4) ජලය බෙදාහැරීමේදී ගම් නායකයින් අතර සාකච්ඡා සිදු කිරීම.

23. ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව විජය රජු මෙරටට පැමිණියේ,
(1) ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ දී.
(2) ක්‍රි.ව. 800 දී.
(3) ක්‍රි.ව. 6 වන සියවස.
(4) ක්‍රි.පූ. 60 දී ය.

24. අතීත ප්‍රභූන්ගේ ජීවිතයේ සුඛිත මුදිත ස්වරූපය නිරූපණය වන ආනයනික පබළු මාලයක් සොයාගනු ලැබූ ස්ථානය වන්නේ,
(1) ඉබ්බන්කටුව සුසාන භූමිය.
(2) අනුරාධපුර නිවාස නටබුන්.
(3) උඩරංචාමඩම නිවාස භූමිය.
(4) හල්දුම්මුල්ල නිවාස කැණීම.

25. අතීතයේ සෙල්ලිපි වල "පොවනි රජ" ලෙස සඳහන් විණි. එහි අර්ථය වන්නේ,
(1) පවුලේ ප්‍රධානියා
(2) පරුමකවරුන්ගේ ප්‍රධානියා
(3) නැගෙනහිර ප්‍රදේශයේ රජු
(4) යුව රජු

26. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය පෙන්නුම් කෙරෙන ප්‍රධාන දර්ශකය වන්නේ,
(1) කුඩා වැව් ගම් වල ව්‍යාප්තිය.
(2) සුසාන භූමි වල සාධක.
(3) තෙත් කලාපීය ලෙන් වල සාක්‍ෂි.
(4) ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර.

27. මුල් ඓතිහාසික යුගයේ මූලික ජනාවාස ව්‍යාප්ත වන්නේ ගංගා නිම්නවල නොව ඊට පිටතින් පිහිටි ප්‍රදේශවලය. ඊට බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ,
(1) වාසස්ථාන වූ ගල්ලෙන් බොහෝ විට ගංගා නිම්නයෙන් පිටත පිහිටා තිබීම.
(2) ස්වභාවික සම්පත් බහුල ප්‍රදේශවලට වැඩි අවධානයක් යොමු කිරීම.
(3) ගංගා හරස් කොට අමුණු බැඳ ඇළ මාර්ග වලින් ජලය ලබා ගැනීම.
(4) විනාශකාරී ගංවතුර පාලනයට සරිලන තාක්‍ෂණයක් මුල් යුගයේ නොතිබීම.

28. තිස්සමහාරාම වැව ඉදිකළ රජතුමා වන්නේ,
(1) කාවන්තිස්ස (2) වසභ (3) දුටුගැමුණු (4) ඉළනාග

29. පැරණි කාලයේ සෙල්ලිපි වල "අවරණ" යනුවෙන් දක්වා ඇත්තේ,
(1) අමුණ ය (2) වැව ය (3) ඇළමාර්ගය (4) ජල උද්‍යානය

30. පහත සඳහන් "අ" සහ "ආ" තීරු දෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. කළුදිය පොකුණ සෙල්ලිපිය | A. තොටුපල අයබදු ලබාගත් තැනැත්තෙකු පිළිබඳව |
| 2. කොත්ගල්කන්ද සෙල්ලිපිය | B. ප්‍රාදේශීය පාලකයකු පිළිබඳව |
| 3. කොරවක්ගල සෙල්ලිපිය | C. දසගම් ඇත්තන් පිළිබඳව |
| 4. යටහලෙන සෙල්ලිපිය | D. ලෙන් පූජාවක යෙදුණු ගම් නායකයින් පිළිබඳ |

(1) ACBD (2) CABD (3) CADB (4) ABDC

31. ක්‍රි.ව. තුන්වන සියවසට අයත් නිවාසයක සාක්ෂිවලින් තහවුරු වූයේ නිවාස බිම සකස් කර ඇත්තේ පොළොව සාරා එහි මතුපිට මැටි ආලේප කිරීමත් බවයි. ඊට අදාල සාක්‍ෂි හමුවන ස්ථානය වන්නේ,
(1) රත්නපුර උඩරංචාමඩම
(2) තිස්සමහාරාම වළගම්පත්තුව
(3) ඌව පළාත හල්දුම්මුල්ල
(4) ගලේවෙල යටිගල්පොත්ත

32. ගමික තෝරා පත්කර ගැනීමේදී ගෘහපතීන් සතු වත්පොහොසත්කම කෙරෙහි අවධානය යොමු කළ බවට සාක්ෂි සපයන මූලාශ්‍රය වන්නේ,
(1) ජාතකට්ඨකථාව (2) මහාවංශය
(3) සමන්තපාසාදිකාව (4) රාජාවලිය

33. පරුමකවරුන් බහුතරය අතරින් ප්‍රධානියා හැඳින්වූ නම වනුයේ,
(1) දසගම ඇත්තන් (2) පරුමකලු
(3) මපුරුමුකා (4) මහාසම්මත

34. දේවානම්පියතිස්ස රජ සමය වන විට දේශපාලන බලය මධ්‍යගත කිරීමේ අවශ්‍යතාවය ඇතිවූයේ කුමන හේතුවක් නිසාද ?
(1) අශෝක අධිරාජ්‍ය සමග සබඳතා පහසු කර ගැනීම සඳහා.
(2) විදේශීය සතුරු ආක්‍රමණවලට නොබියව මුහුණ දීම සඳහා.
(3) පරිපාලන කටයුතු වඩා පහසුවෙන් සිදුකිරීම සඳහා.
(4) ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ වීමේදී ස්වාධීන රටක් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය.

35. "අලකපය මහරජ" ලෙස සෙල්ලිපි වල හැඳින්වූ රජු වන්නේ,
(1) කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (2) පළමුවන කාශ්‍යප
(3) පළමුවන විජයබාහු (4) මහසෙන්

36. "අ" තීරුව හා (ආ) තීරුව නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. අස අදෙක | A. වත්සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරි |
| 2. කොතුරු ගැ නා | B. නාගරික වාස්තු විද්‍යාඥ |
| 3. නගර වුඩික | C. වෙළඳ කටයුතු භාර ප්‍රධානී |
| 4. පන අදෙක | D. අශ්ව අංශයේ ප්‍රධානී |

(1) ACBD (2) CABD (3) DABC (4) DACB

- **A සිට E දක්වා ප්‍රකාශ ඇසුරින් 37, 38 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා
B. අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කර ගැනීම.
C. විශාල වැව් ඉදිකිරීමේ පුරෝගාමියා වීම.
D. කුඩා කල කීර්ති කුමරු ලෙස හැඳින්වූ එතුමා රුහුණු ප්‍රදේශයේ හැදී වැඩුණි.
E. රජයේ බදු අය කිරීම වඩාත් ක්‍රමවත් කිරීම.

37. ඉහත දැක්වෙන තොරතුරු අතරින් වසභ රජතුමා සම්බන්ධයෙන් අදාල වන තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
(1) ACE පමණි. (2) ABC පමණි. (3) BCE පමණි. (4) A හා C පමණි.

38. ඉහත ප්‍රකාශ අතුරින් පළමුවන විජයබාහු රජු සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශ වන්නේ,
(1) B හා C පමණි. (2) A,B,D පමණි. (3) B හා D පමණි. (4) A,C,D පමණි.

39. පංචකකුධ භාණ්ඩ අතරට අයත් නොවන්නකි,
(1) මගුල් කඩුව (2) සේසත (3) වල් විදුනාව (4) සිංහාසනය

40. රෝමයෙන් විදුරු පබළු ගෙන්වා රුවන්වැලි මහ සෑයට මහා පූජාවක් කළ රජතුමා වන්නේ,
(1) දුටුගැමුණු රජු (2) භාතිකාභය රජු
(3) සද්ධාතිස්ස රජු (4) දේවානම්පියතිස්ස රජු

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 33 | S | II |
|---|---|---|

Grade 10 – First Term Test – July 2023

කාලය : පැය 3
Time: 3 hours

පළමු වාර පරීක්ෂණය - 2023 - 10 ශ්‍රේණිය

# ඉතිහාසය - II

Name: - ........................................ Class: -.................. Index no: - ........................

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ත්‍රිකුණාමලය, මිහින්තලේ (sic) — 

(i) ත්‍රිකුණාමලය, මිනිහාගල්කන්ද, මල්වතු ඔය, සීගිරිය, රංචමඩම, මාතොට, වලවේ ගඟ, අනුරාධපුරය, කාලතිත්ථ, දඹකොළ පටුන, මඩකලපුව, කොළඹ (ලකුණු 12)

(ii) චීනය, බෙංගාල බොක්ක, මලක්කා සමුද්‍ර සන්ධිය, මධ්‍යධරණී මුහුද, ඉතාලිය, ජාවා දූපත (ලකුණු 6)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාල පිළිතුර ලියන්න.

A- මහාවංශය රචනා කළ මහානාම හිමියන් වැඩ විසූ පිරිවෙන.

B - ගල්පොත සෙල්ලිපිය කරවූ රජතුමා.

C - පළමුවන විජයබාහු රජුට කුඩා කළ ආරක්ෂාව සැපයූ නිලධාරියා.

D - දැව මාධ්‍ය යොදා ගනිමින් ලියූ අභිලේඛන සහිත සුප්‍රසිද්ධ ස්ථානය. (ලකුණු 4)

A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii)



A.

(i) A පින්තූරයෙන් දැක්වෙන්නේ කවුද ?
(ii) ඔහු කුමන ජාතිකයෙක්ද ?
(iii) ඔහු ජීවත් වූ ප්‍රදේශය නම් කරන්න.
(iv) එතුමා කුමන විෂය ක්ෂේත්‍රය සම්බන්ධව වැදගත් වන්නේද? (ලකුණු 4)

(iii)



B.

(i) B පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද ?
(ii) එම ස්ථානය පිහිටි ප්‍රදේශය නම් කරන්න.
(iii) එම ප්‍රදේශය අයත් දිස්ත්‍රික්කය නම් කරන්න.
(iv) මෙම ස්ථානය කොපමණ කාලයක් පැරණි ලෙස දක්වා තිබේද ? (ලකුණු 4)

PAST PAPERS WIKI

## II කොටස

02. (i) දේශීය සාහිත්‍ය මූලාශ්‍ර යටතට ගැනෙන හටන් කාව්‍ය 3ක් නම් කරන්න. (ල. 3)
(ii) ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගන්නා අවස්ථාවේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) සාහිත්‍ය මූලාශ්‍ර වල ප්‍රයෝජන 2ක් ලියා නිදසුන් සමගින් පැහැදිලි කරන්න. (ල. 5)
(iv) ඉතිහාසය ඉගෙනීම වැදගත් වන්නේ ඇයි දැයි කරුණු 3 ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 6)

03. (i) විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර ලෙස ගැනෙන ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් දෙමළ ග්‍රන්ථ 3ක් ලියා දක්වන්න. (ල. 3)
(ii) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර යටතේ දැක්වෙන සෙල්ලිපි වර්ග 4ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) පුරාණ නටබුන් මෙරට ඉතිහාසය හැදෑරීමට අගනා මූලාශ්‍රයකි. නටබුන් තුළින් සාක්ෂි සපයන අංශ 2 ක් ලියා නිදසුන් සමගින් පැහැදිලි කරන්න. (ල. 5)
(iv) මෑත කාලීනව පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තර්ජනයට ලක්වීමෙන් පවතී. පුරාවිද්‍යාත්මක සාධක විනාශයට ලක්වන ආකාර 3 ක් ලියා පැහැදිලි කරන්න. (ල. 6)

04. (i) මෙරට ඉතිහාසයේ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා කාලයට අයත් ධර්ම ග්‍රන්ථ 3ක් ලියා දක්වන්න. (ල. 3)
(ii) පැරණි සෙල්ලිපි පිහිටුවනු ලැබුවේ විවිධ කරුණු වාර්තා කර තැබීමටයි. සෙල්ලිපි වලින් හෙළිවන කරුණු 4ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) පැරණි කාසි ඉතා වැදගත් මූලාශ්‍රයකි. ඒවා මගින් අධ්‍යයනය කළ හැකි විශේෂ කරුණු 2ක් ලියා පැහැදිලි කරන්න. (ල. 5)
(iv) පැරණි චිත්‍ර, මූර්ති සහ කැටයම් අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කෙරෙන ජීවමාන සාක්ෂි වේ. එමගින් අවබෝධය ලබාගත හැකි කරුණු 3ක් ලියා පැහැදිලි කරන්න. (ල. 6)

05. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය වාසස්ථාන 3ක් ලියා දක්වන්න. (ල. 3)
(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ප්‍රධාන පරිසර කලාප 6කි. ඉන් 4ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ දක්නට ලැබුණු විශේෂතා කරුණු 2ක් ලියා විස්තර කරන්න. (ල. 5)
(iv) ගල් යුගයේ මානවයාගේ අභිචාරවිධි වල ස්වරූපය නිදසුන් 3ක් මගින් පැහැදිලි කරන්න. (ල. 6)

06. (i) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ භෞතික පසුබිමට අයත් සාධක තුනක් ලියා දක්වන්න. (ල. 3)
(ii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය, ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්වී පෙනෙන කරුණු 4ක් ලියා දක්වන්න. (ල. 4)
(iii) පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය තුළ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ 2ක් ලියා විස්තර කරන්න. (ල. 5)
(iv) මුල් ඓතිහාසික ජනාවාසවල ව්‍යුහය සහ ස්වරූපය කරුණු 3ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 6)

07. (i) මහාවංශයේ සඳහන් වැව් ගම් 3ක් ලියා දක්වන්න. (ල. 3)
(ii) පහත සඳහන් වචන වල අර්ථ ලියා දක්වන්න.
A - පුර කමත
B - නුරුපුර
C - තකර
D - ගහපති
(ල. 4)



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාවේ ස්වරූපය කරුණු 2ක් යටතේ පැහැදිලි කරන්න.

(ල. 5)

(iv) පූර්ව ඓතිහාසික යුගයේ සුසාන භූමි වර්ග 3ක් නම් කොට නිදසුන් සමග ඒවායේ ස්වරූපය විස්තර කරන්න.

(ල. 6)

08. (i) සෙල්ලිපිවල පරුමකවරුන් ලෙස හඳුන්වා දුන් සෙන්පතිවරු තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

(ii) අතීත රාජ්‍ය පරිපාලන සැකැස්මට අනුව පහත නිලධාරීන් හඳුන්වන්න.

A – රූප අදෙක | C – බතගු
B - කනපෙඩික | D – බඩගරික

(ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරයන් 2ක් ලියා නිදසුන් සමග පැහැදිලි කරන්න. (ල. 5)

(iv) ඓතිහාසික මූලාශ්‍රවලට අනුව අනුරාධපුර රාජධානියේ ප්‍රථම රජු වන පණ්ඩුකාභය රජුගේ සේවාවන් 3ක් ලියා පැහැදිලි කරන්න.

(ල. 6)

9. (i) අතීත රජවරුන්ගේ ක්‍රියාකලාපය සහ පෙනී සිටීමට උත්සාහ කළ ස්වරූපය අනුව රාජ්‍යත්ව සංකල්ප ගොඩනැගී ඇත. ඉන් 3ක් ලියා දක්වන්න. (ල. 3)

(ii) පහත වචන වල අර්ථ ලියා දක්වන්න.

A – ආස්ථාන | C – තොට බොජක
B - නකදිව | D – එල්ලංගාව

(ල. 4)

(iii) අතීතයේ දේශපාලන බලය මධ්‍යගත වීමේදී රජු බලසම්පන්න ස්වරූපයකින් පෙනී සිටියේය. අතීත රජවරුන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් 2ක් ලියා නිදසුන් සමග පැහැදිලි කරන්න. (ල. 5)

(iv) මෙරට ඉතිහාසයට එකතුවන විශිෂ්ට රජෙකු ලෙස දුටුගැමුණු රජුගේ සේවය කරුණු 3ක් යටතේ නිදසුන් සමග පැහැදිලි කරන්න.

(ල. 6)